# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2017 දෙසැම්බර්

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2017 දෙසැම්බර් මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 7.3%ක් දක්වා අඩු වූ බව ප්‍රකාශ කලේය. පසුගිය නොවැම්බර් මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 8.4%ක් ලෙස වාර්තා විය. 2017 දෙසැම්බර් මාසයේ උද්ධමනය 7.3% දක්වා අඩුවුවද ඊට පෙර මාස තුනෙහිම (2017 නොවැම්බර්, ඔක්තෝම්බර්, සැප්තැම්බර්) උද්ධමනය 8.0% වඩා වැඩි විය. මෙම මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 5.7%ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.6%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2016 දෙසැම්බර් මාසයේ පොල් සහ එළවළු යන ආහාර ද්‍රව්‍යවල මිළ ගණන් පහළ මට්ටමක පැවතීම නිසා, එහි ප්‍රථිඵලයක් ලෙස එම මාසයේ උද්ධමනය 4.2%ක් වූ අතර, ආහාර කාණ්ඩයේ දායකත්වය 1.0%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 3.2%ක් විය.

කෙසේ නමුත් ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2017 නොවැම්බර් මාසයේ 126.4ක් වූ දර්ශක අගය 2017 දෙසැම්බර් මාසයේ 126.6ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2017 දෙසැම්බර් මාසයේ දර්ශකාංක 0.2ක වැඩිවීමක් හෝ 0.2ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.12%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.03%කින් වැඩිවීම බලපා ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා එළවළු, අළුත් මාළු, රතුළූණු, පොල්, පැපොල්, බිත්තර, පොල්තෙල් සහ තේ කොළ යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් සහල්, අමු මිරිස්, කෙසෙල්, මයිසූර් පරිප්පු, අර්තාපල්, දෙහි සහ කරවල යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2017 දෙසැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා ‘ප්‍රවාහන’ සහ ‘රෙදිපිළි හා පාවහන්’ යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. තවද ‘ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු’, ‘ආපනශාලා හා හෝටල්’ සහ ‘විවිධ භාණ්ඩ හා සේවා’ යන කාණ්ඩවල වියදම්වල වටිනාකමෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වේ. එසේ වුවත් ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය’ යන කාණ්ඩයේ වියදම්වල වටිනාකමෙහි අඩුවීමක් වාර්තා වේ. මෙම මාසය තුළ ‘නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන’, ‘සෞඛ්‍ය’, ‘සන්නිවේදන’, ‘විනෝදාත්මක හා සංස්කෘතික’ සහ ‘අධ්‍යාපන’ යන කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2016** | දෙසැම්බර් | 118.0 | 1.2 | 4.2 |
| **2017** | ජනවාරි | 119.3 | 1.1 | 6.5 |
| | පෙබරවාරි | 119.9 | 0.5 | 8.2 |
| | මාර්තු | 119.5 | -0.3 | 8.6 |
| | අප්‍රේල් | 121.0 | 1.3 | 8.4 |
| | මැයි | 121.8 | 0.7 | 7.1 |
| | ජූනි | 123.4 | 1.3 | 6.3 |
| | ජූලි | 122.4 | -0.8 | 6.3 |
| | අගෝස්තු | 122.3 | -0.1 | 7.9 |
| | සැප්තැම්බර් | 123.3 | 0.8 | 8.6 |
| | ඔක්තෝම්බර් | 124.8 | 1.2 | 8.8 |
| | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |
| | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව